JMC vLearning
"your virtual learning partner"

# LKAS 23 : ණය ගැනුම් පිරිවැය

## AAT අදියර III

FAR - මූල්‍ය වාර්තාකරණය

සංදීප ජයසේකර
ACA, B.Sc. (Accounting) Sp. Hons., ACMA (SL), SAT, CIMA Passed Finalist,
Reading for MBA (PIM), CA and CIMA Prize Winner

JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Sir Chittampalam A Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

1

Sandeepa Jayasekera - JMC

# AAT තෙවෙනි අදියර මූල්‍ය වාර්තාකරණය

Sandeepa Jayasekera

B.Sc. (Acct.) Hons. Gold Medal Winner, ACA, SAT, ACMA (UK), CGMA (UK), CA Prize Winner for AFR subject in Strategic Level II, CA First in Order of Merit Prize Winner in CAB II Level, CIMA Strategic Level Aggregate Prize Winner, Reading for MBA (PIM-SJP).

1

JMC vLearning "your virtual learning partner"


# LKAS – 23 ණය ගැණුම් පිරිවැය
# LKAS 23 – Borrowing Cost



2

# මොකද්ද ණය ගැනුම් පිරිවැය කියන්නේ?

ණය පොළිය





3

# ණය ගැණුම් පිරිවැය කියන්නේ

ණයට ගත් මුදල් මත ඇතිවන



පොළී පිරිවැය



කල්බදු පොලිය



විදේශ මුදලින් ගත් ණය මත ඇතිවන විනිමය වෙනස්කම්





4

JMC vLearning "your virtual learning partner"

## ප්‍රශ්න අංක 01

පහත අයිතම ණයගැණුම් පිරිවැයක් වන්නේ ද නොවන්නේ ද යන්න සඳහන් කරන්න.

1.1 ලංකා බැංකුවෙන් ගත් ණය මත ඇතිවන පොලිය
1.2 සම්පත් බැංකු ස්ථාවර තැන්පතුවෙන් ලද පොලිය
1.3 LB ලීසිං සමාගමෙන් ගත් කල්බදු පහසුකම මත ගෙවන පොලිය
1.4 බැංකු ණය මුදල ලබා ගැනීම්දී වැය වූ නීතිඥ ගාස්තුව
1.5 ගොඩනැගිල්ලක් කුලියට ලබා ගැනීම මත ගෙවූ කුලිය
1.6 විදේශීය බැංකු ණය මුදල පියවීමේදී ඇති වූ විදේශ විනිමය ලාභය
1.7 විදේශ බැංකු ණය මුදල මත ඇති වූ විදේශ විනිමය අලාභය

Sandeepa Jayasekera - JMC 5

5

## සුදුසුකම් ලබන වත්කම් කියන්නේ මොනවාද?

අපේක්ෂිත භාවිතයට හෝ විකිණීමට

සූදානම් කිරීමට

සැළකිය යුතු කාලයක් ගතවන වත්කම් (සාමාන්‍යයෙන් මාස 06 ක් හෝ ඊට වැඩි)

6

JMC vLearning "your virtual learning partner"

## සුදුසුකම් ලබන වත්කම් තුලට ඇතුලත් විය හැකි දෑ

තොග (ගුවන් යානා, නැව්)

දේපළ, පිරියත හා උපකරණ
(ගොඩනැගිලි, නිවාස, තට්ටු නිවාස, මාර්ග)

අස්පෘශ්‍ය වත්කම් (පේටන්ට් අයිතීන්, මෘදුකාංග)

ආයෝජන දේපළ (ගොඩනැගිලි)

Sandeepa Jayasekera - JMC 7

7

## ප්‍රශ්න අංක 02

පහත වත්කම් සුදුසුකම් ලබන වත්කම් වන්නේ ද? නැත්ද? යන්න සඳහන් කරන්න.

2.1 20X0/4/1 දින මිලදී ගත් යාන්ත්‍රාගාරය ස්ථාපනය කර අවසන් වන විට 20X0/6/1 දින විය.

2.2 20X1/1/1 දින ආරම්භ කළ මෘදුකාංග නිර්මාණ ව්‍යාපෘතිය 20X1/9/3 වන දින අවසන් විය.

2.3 ඇඟළුම් නිෂ්පාදන ආයතනයක්, මාස 02 ක නිෂ්පාදන කාලයක් සහිත නිමි ඇඳුම් තොග

2.4 මාස 08 ක නිෂ්පාදන කාලයක් ගතවන ගුවන්යානා නිෂ්පාදන ආයතනයක ඇති ගුවන්යානා

2.5 වසරක කොන්ත්‍රාත් කාලයක් සහිත ගොඩනැගිලි ඉදිකිරීම

2.6 භාවිතයට නොගන්නා ඉඩම

Sandeepa Jayasekera - JMC 8

8

JMC vLearning "your virtual learning partner"

## ණය ගැණුම් පිරිවැය හඳුනාගැනීම

ණය ගැණුම් පිරිවැය ඇති වූවේ,

- සුදුසුකම් ලබන වත්කම්
  - වත්කමට ප්‍රාග්ධනිත කළ යුතුය
    - නිශ්චිත අරමුදලක්
      - ශුද්ධ පොලී වියදම ප්‍රාග්ධනිත කළ යුතුය
        - පොලී වියදම − අතිරික්ත මුදල් ආයෝජනයෙන් ලද ආයෝජන ආදායම
    - පොදු අරමුදලක්
      - හරිත සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය (WACC) යොදාගෙන ගණනය කරන දළ පොලී වියදම ප්‍රාග්ධනිත කළ යුතුය
- වෙනත් වත්කම්
  - ලාභාලාභ ගිණුමට කපාහළ යුතුය.

9

9

| නිශ්චිත ණය අරමුදලක් කියන්නේ? | පොදු ණය අරමුදලක් කියන්නේ? |
|---|---|
| | |

10

JMC vLearning
"your virtual learning partner"

## හරිත සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය ගණනය කරන ආකාරය

| සලකා බලන කාලපරිච්ඡේදයට අදාල මුළු පොලිය |   |   |
|---|---|---|
| ───────── | × | 100 |
| සලකා බලන කාලපරිච්ඡේදය තුල පැවති මුළු ණය මුදල |   |   |



## ප්‍රශ්න අංක 03

20X1/1/1 දින ෂෙනාල් සමාගම HSBC බැංකුවෙන් ගොඩනැගිලි ඉදිකිරීමක් සඳහා 10% ක පොලී අනුපාතයක් යටතේ රු. මිලියන 30 ක් ලබා ගන්නා ලදී. ගොඩනැගිල්ල ඉදිකිරීමට මාස 09 ක කාලයක් ගත වේ.
එදිනම කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් රු. මිලියන 10 ක ණය මුදලක් 12% ක පොලී අනුපාතයක් යටතේ ලබා ගන්නා ලදී. සමාගමේ මෙහෙයුම් චක්‍රය මාස 03 කි. මූල්‍ය වර්ෂය දෙසැම්බර් 31 න් අවසන් වේ.

1. ඉහත වත්කම් දෙක අතුරින් සුදුසුකම් ලබන වත්කම් හඳුනා ගන්න.
2. එක් එක් ණය මුදල සඳහා වෙන වෙනම පොලිය ගණනය කරන්න.
3. LKAS 23 ප්‍රමිතියට අනුව පොලී වියදම් ගිණුම්ගත කළ යුතු ආකාරය පැහැදිලි කරන්න.



JMC vLearning "your virtual learning partner"

# පිළිතුරු අංක 03



JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න අංක 04

මන්සල සමාගම 20X0/1/1 දින 10% ක පොලී අනුපාතයක් යටතේ රු. මිලියන 10 ක් HNB බැංකුවෙන් ලබා ගන්නා ලදී. මෙම ණය මුදල ලබා ගත්තේ ව්‍යාපාරයේ නවතම ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වන අතර එහි ව්‍යාපෘති කාලය වර්ෂයක් වේ. ලබාගත් ණය මුදලෙන් 50% ක් පළමු දිනයේම ව්‍යාපෘතිය සඳහා යෙදවූ අතර ඉතිරිය 5% ස්ථාවර තැන්පතුවක යොදවන ලදී 20X0/10/1 දින ස්ථාවර තැන්පතුව ඉවත් කරගත් අතර එම මුදල ව්‍යාපෘතිය සඳහා යොදවන ලදී. මූල්‍ය වර්ෂය 12/31 න් අවසන් වේ.

1. මෙම ගොඩනැගිල්ල සුදුසුකම් ලබන වත්කමක් ලෙස හඳුනාගත හැකිද?
2. පොලී පිරිවැය සහ පොලී ආදායම ගණනය කරන්න.
3. LKAS 23 අනුව ප්‍රාග්ධනිත කළ යුතු පොලී පිරිවැය ගණනය කරන්නී එහි ද්විත්ව සටහන දක්වන්න.

# පිළිතුරු අංක 04





# ප්‍රශ්න අංක 05

සුදාර සමාගම තම ව්‍යාපාරය වෙනුවෙන් පහත පරිදි ණය මුදල් ලබාගෙන ඇත

| බැංකුව | රු. මිලියන ණය මුදල | පොලී අනුපාතය |
|---|---|---|
| සම්පත් බැංකුව | 30 | 10% |
| යූනියන් බැංකුව | 50 | 10.2% |
| ලංකා බැංකුව | 20 | 10.1% |





JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න අංක 05

මෙම අරමුදල් තුලින් රු. මිලියන 50ක මුදලක් 20X1/1/1 දින යන්ත්‍රාගාර ව්‍යාපෘතියක් වෙනුවෙන් යොදවන ලදී. එය සම්පූර්ණ වූයේ 20X1/9/30 වන දින එම මාස 9 ක කාලය තුල රු. මිලියන 1 ක් ආයෝජන ආදායම ලෙස උපයා ගන්නා ලදී.

1. යන්ත්‍රාගාරය සුදුසුකම් ලබන වත්කමක් ලෙස සැලකිය හැකිද?
2. හරිත සාමාන්‍ය ප්‍රාග්ධන පිරිවැය ගණනය කරන්න.
3. ආයෝජන ආදායම ගිණුම්ගත කළ යුතු ආකාරය පැහැදිලි කරන්න.
4. ප්‍රාග්ධනිත කළ යුතු පොලී වියදම කොපමණ වේද? එහි ද්විත්ව සටහන දක්වන්න.



JMC vLearning "your virtual learning partner"

# පිළිතුරු අංක 05

# පිළිතුරු අංක 05

Sandeepa Jayasekera - JMC 19

19

## ණය ගැණුම් පිරිවැය ප්‍රාග්ධනිත කරන එක පටන්ගන්න තියෙන්න ඕන නිර්ණායක

| | | |
|---|---|---|
| වත්කම මත වියදම් දරලා තියෙන්න ඕනි | ණයගැණුම් පිරිවැය දරලා තියෙන්න ඕනි | වත්කම අපේක්ෂා කරන තත්ත්වයට නොව විකිණීමට ගේන්න අවශ්‍ය ක්‍රියාකාරකම් ආරම්භ කරලා තියෙන්න ඕනි |

උදාහරණ - බැංකු ණය මුදලකින් හදන ගොඩනැගිල්ලක, ණය ගත් පසු මාස 03 ගත වෙනකන් ගොඩනැගිල්ල හදන එක ආරම්භ කරන්න බැරි වුණා නම්, ඒ මාස 03 දී ණය ගැණුම් පිරිවැය ප්‍රාග්ධනිත කරන එක ආරම්භ කරන්න බෑ

20

## වත්කම සකස් කිරීමේ කාර්යය තාවකාලිකව නතර වුණොත් ඒ කාලයේ ණයගැණුම් පිරිවැයට මොකද කරන්නේ?

- අනපේක්ෂිත හේතුවක් මත නම්
- පෙර සැළසුම් නොකළ දෙයක් නම්
- කළමනාකාරීත්වයේ පාලනයෙන් තොරයි නම්

ණයගැණුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීම තාවකාලිකව නවතා ලාභාලාභ ගිණුමට කපා හල යුතුය.

- අපේක්ෂිත හේතුවක් නම්
- පෙර සැළසුම් කළ දෙයක් නම්
- කළමනාකාරීත්වයේ පාලනය තුල නම් (ප්‍රමාණාත්මක තාක්ෂණික හෝ පරිපාලනමය කටයුත්තක් නම්)

එම කාලයටත් ණය ගැණුම් පිරිවැය ප්‍රාග්ධනිත කළ යුතුය.

21

## ණය ගැණුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීම නතර කිරීම.

- වත්කම සකස් කිරීමේ ක්‍රියාකාරකම් සම්පූර්ණයෙන් පාහේ ප්‍රමාණවත් පරිදි අවසන් වී ඇතිනම්
- සුළු වෙනස් කිරීම් සහ පරිපාලනමය කටයුතු තිබුණාද ප්‍රාග්ධනිත කිරීම නැවතිය යුතුය.
- කොටස් වශයෙන් ඉදිකරන වත්කමක් නම් (උදා: සාප්පු සංකීර්ණයක්) අවසන් වී නැති කොටස්වල ණයගැණුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීම අවසන් වන තුරු දිගටම සිදු කළ යුතුය.

22

JMC vLearning "your virtual learning partner"

## හෙළිදරව් කිරීම්

| ගිණුම්කරණ ප්‍රතිපත්තිය | ප්‍රාග්ධනිත කළ ණය ගැණුම් පිරිවැය | හරිත සාමාන්‍ය ප්‍රාග්ධන ප්‍රමාණය |
|---|---|---|

23

## ප්‍රශ්න අංක 06

නවීන් සමාගම ජල විදුලි ව්‍යාපෘති සිදු කරයි 20X6/11/30 වන දින ලක්ෂපාන ප්‍රදේශයේ ජල විදුලි ව්‍යාපෘතියක් සඳහා විදුලිබල අමාත්‍යාංශයේ අවසරයට ලබා ගන්නා ලදී 20X6/12/15 වන දින ඉදිකිරීම් කටයුතු ආරම්භ කරමින් ඉඩම හෙළිපෙහෙලි කිරීම ආරම්භ කරන ලදී. ව්‍යාපෘතියේ ඉදිකිරීම මූල්‍යනය කිරීම සඳහා DFCC බැංකුවෙන් 15% ක පොලී අනුපාතයක් යටතේ රු. මිලියන 100 ක මුදලක් ලබා ගන්නා ලදී.

එම ණය මුදලින් 50% ක ප්‍රමාණයක් 8% ක ස්ථාවර තැන්පතුවක දමන ලද අතර එම ස්ථාවර තැන්පතුව 20X7/8/30 දින කල් පිරුණි.



24

JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න අංක 06

20X7/03/01 දින අයහපත් කාලගුණ තත්ත්වය හේතුවෙන් ඉදිකිරීම් කටයුතු දවස් 15 ක කාලයක් සඳහා අත්හිටුවීමට සිදු විය. මෙම කාලයට වර්ෂාව අධික වීම සාමාන්‍ය අපේක්ෂිත තත්ත්වයක් විය.

20X7/04/01 සිට පුරා දින 15 ක් ඉදිකිරීම් කටයුතු අවුරුදු නිවාඩුව වෙනුවෙන් තාවකාලිකව නවතා තබන ලදී.

20X7/05/15 වන දින සේවකයන් විසින් වර්ජනයක් දියත් කළ අතර එය පුරා දින 15 ක කාලයක් පැවතුණි.

ප්‍රදේශයේ ජනතාව මෙම  ජල විදුලි ව්‍යාපෘතියට විරෝධතාවයක් දියත් කර අතර එය 20X7/06/01 සිට දින 7 ක් පැවැත්වුණි.

Sandeepa Jayasekera - JMC 25

25

# ප්‍රශ්න අංක 06

20X7/12/15 වන දින පරිසර අධිකාරිය අනිවාර්ය පරීක්ෂා කිරීම ආරම්භ කළ අතර දින 15 ක් පැවති එම කටයුතු අවසානයේ පරිසර අනුකූලතා සහතිකය නිකුත් කරන ලදී. මෙම කාලය තුලද ඉදිකිරීම් කටයුතු තාවකාලිකව නැවතෙන ලදී.

20X8/06/01 දින වන විට ව්‍යාපෘතිය ප්‍රමාණාත්මකව අවසන් වූ අතර සුළු වෙනස්කම් කිහිපයක් පමණක් ඉතිරිව තිබුණි. මෙම කටයුතු සම්පූර්ණ කරගෙන විදුලි ජනනය කිරීම 20x8/06/30 දින සිට ආරම්භ විය.

පොලී පිරිවැය හැර සමස්ත ව්‍යාපෘති වියදම රුපියල් මිලියන 125 ක් විය.

ව්‍යාපාරයේ මූල්‍ය වර්ෂය 6/30 න් අවසන් වේ

Sandeepa Jayasekera - JMC 26

26

JMC vLearning "your virtual learning partner"

# ප්‍රශ්න අංක 06

1. මෙම ජල විදුලි බලාගාරය සුදුසුකම් ලබන වත්කමක් ද?
2. ණය ගැණුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීම ආරම්භ කළ යුතු වන්නේ කවදාද?
3. ආයෝජන ආදායම ගිණුම්ගත කළ යුත්තේ කෙසේද?
4. ණය ගැණුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීම අවසන් කළ යුතු වන්නේ කවදාද?
5. ව්‍යාපෘතියේ ප්‍රාග්ධනිත කළ යුතු සහ ලාභාලාභ ගිණුමට අය කළ යුතු ණය ගැණුම් පිරිවැය ගණනය කරන්න.
6. ණය ගැණුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීමෙන් පසු ව්‍යාපෘතියේ මුළු පිරිවැය කොපමණ වේද?



JMC vLearning
"your virtual learning partner"

# පිළිතුරු අංක 06

# පිළිතුරු අංක 06





# පිළිතුරු අංක 06





JMC vLearning "your virtual learning partner"

## ප්‍රශ්න අංක 07

ශෂිනි සමාගම තම ව්‍යාපාරය තුල ඇති පොදු අරමුදල් යොදාගෙන ප්‍රදර්ශනාගාරයක් ඉදි කිරීමට සැළසුම් කරයි.
ව්‍යාපාරය සතුව ඇති පොදු අරමුදල් පහත පරිදි වේ

| බැංකුව | ණය රු. මිලියන | පොලී අනුපාතය |
|---|---|---|
| කොමර්ෂල් බැංකුව | 40 | 10% |
| ලංකා බැංකුව | 20 | 9% |
| HNB බැංකුව | 15 | 12% |
| HSBC බැංකුව | 25 | 15% |



JMC vLearning "your virtual learning partner"

## ප්‍රශ්න අංක 07

සම්පූර්ණ ව්‍යාපෘතිය සඳහා රු. මිලියන 50 ක් වැය වේ. 20x7/04/01 දින ආරම්භ විය. රජය විසින් පැන වූ ආනයන සීමාවන් නිසා අමුද්‍රව්‍ය සැපයීමේ ප්‍රමාදයක් ඇති වූ අතර මේ හේතුවෙන් 20x7/05/15 සිට දින 15 ක් ඉදිකිරීම තාවකාලිකව නවතා දමන ලදී. ප්‍රදර්ශනාගාරය 20x7/12/31 දින වන විට අවසන් වූ අතර 20x8/02/01 දින සිට භාවිතය ආරම්භ කරන ලදී. ව්‍යාපාරයේ මූල්‍ය වර්ෂය 3/31 න් අවසන් වේ. මෙම කාලය තුල රු. මිලියන 1 ක ආයෝජන ආදායමක් උපයා ගන්නා ලදී.

1. මෙම ප්‍රදර්ශනාගාරය සුදුසුකම් ලබන වත්කමක් වන්නේද?
2. හරිත සාමාන්‍ය ප්‍රාග්ධන අනුපාතය ගණනය කරන්න.
3. ආයෝජන ආදායම ගිණුම්ගත කළ යුතු ආකාරය පැහැදිලි කරන්න.
4. ණය ගැණුම් පිරිවැය ප්‍රාග්ධනිත කිරීම අවසන් කළ යුතු දිනය කවදාද?
5. ප්‍රාග්ධනිත කළ යුතු හෝ ලාභාලාභ ගිණුමට අය කළ යුතු ණය ගැණුම් පිරිවැය ගණනය කරන්න.

## පිළිතුරු අංක 07

Sandeepa Jayasekera - JMC 33

33

## පිළිතුරු අංක 07

Sandeepa Jayasekera - JMC 34

34

JMC vLearning "your virtual learning partner"